# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 1 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2004** ජනවාරි මස **06** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 ජනවාරි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. **10.75** යි. තැපැල් ගාස්තුව **:** රු. **4.50** යි.

## 2004 අංක 1 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 ජනවාරි මස 06 වන දින]

එල්. ඩී.— ඕ. 45/2003.

### දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත, 2004 අංක 1 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත, එහි 6 වන වගන්තියේ "භාණ්ඩාගාර බිල්පත් සඳහා මුදල් ගෙවිය යුතු වූ විට, කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ගෙවනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට "මහා භාණ්ඩාගාරයේ දී ගෙවනු ලැබිය යුතු ය : — (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුව ද, "භාණ්ඩාගර බිල්පත සඳහා ගෙවීම් කළ යුතු දිනය, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව පවතින දිනයක් නොවුවහොත්, නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටියකට අනුව ගෙවීම් කරනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 7අ, 7ආ සහ 7ඇ වගන්ති ලෙස බලාත්මක වන්නේ ය :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ, 7ආ සහ 7ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"ප්‍රාථමික අලෙවිකරුවන් සහ අලෙවි කරුවන් නොවන ලංසු තබන්නන්ගේ ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය හා සමීක්ෂණය කළ යුතු බව.

7අ. ලිඛිත සහතික සවරූපයෙන් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනුවලට අදාළව ප්‍රාථමික අලෙවිකරුවන් සහ නාමෝද්දිෂ්ට අලෙවිකරුවන් නොවන ලංසු තබන්නන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ සමීක්ෂණය කිරීම, මේ ආඥාපනතේ අන්තර්ගත කිසිවකට අගතියක් නොමැතිව, විශේෂයෙන් 8, 9, 10 සහ 11 වන වගන්තිවල විධිවිධානවලට අගතියක් නොමැතිව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය යුතු ය.

සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම.

7ආ. භාණ්ඩාගාරය විසින්, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ස්වරූපයෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලැබිය හැක්කේ යම් දිනයක සිට ද ඒ

2-H 19291-4,500 (2003/09)

දිනය, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ සහ දේශීය පුවත් පත් දෙකක, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළකරනු ලබන නිවේදනයක් මගින්, මහජනයා වෙත නිවේදනය කරනු ලැබිය හැකි ය.

ලිඛිත සහතික ස්වරූපයෙන් නිකුත් කළ භාණ්ඩාගාර බිල්පත් පරිවර්තනය කිරීම.

7ඇ. (1) ලිඛිත සහතික ස්වරූපයෙන් නිකුත් කළ, නිශ්චිත කල්පිරීමේ දිනයක් සහිත භාණ්ඩාගාර බිල්පත් දරන්නන්ට එම බිල්පත් නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටියකට අනුකූලව සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් බවට පරිවර්තනය කිරීම සඳහා, ඔවුන් එම බිල්පත් එසේ පරිවර්තනය කිරීමට කැමැත්තේ නම්, ආපසු භාර දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගැසට් පත්‍රයේ සහ දේශීය පුවත්පත් දෙකක සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරනු ලබන නිවේදනයක් මගින් නියම කළ හැකි ය. එම භාණ්ඩාගාර බිල්පත් එසේ පරිවර්තනය කරනු ලැබූ විට, මේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, සහතික රහිත භාණ්ඩාගාර බිල් පත්‍රයක් බවට පරිවර්තනය නොකළ භාණ්ඩාගාර බිල්පත්‍රයක් පිළිබඳව මේ ආඥාපනත යටතේ ආණ්ඩුවේ බැඳීම කෙරෙහි බලපාන ලෙස හෝ එම බැඳීම නිදහස් කිරීමක් ලෙස (1) වන උපවගන්තියේ අන්තර්ගත කිසිවක් අර්ථ කථනය නොකළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් කල් පිරීමේ දී එවැනි ගිණුම් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් ඒ සඳහා හිමිකමක් ඇති ගනුදෙනුකරුවන්ට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු කාල සීමාව";

(2) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "ආකාරය හා ක්‍රමය" යන වචන වෙනුවට "ආකාරය හා ක්‍රමය;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) ශ්‍රී ලංකා මහ බැංකුවට තොරතුරු සැපයීම සහ එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ආකාරය, ක්‍රමය සහ කාලසීමා කවරේද යන වග."

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සෘජු සහභාගිකරුවන්.

9. (1) ශ්‍රී ලංකා මහා බැංකුව විසින්, ප්‍රාථමික අලෙවිකරුවකු හෝ වෙනත් තැනැත්තකු හෝ සෘජු සහභාගිකරුවකු ලෙස ලිඛිතව පත්කළ හැකි අතර ඔහුට (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන පරිදි වූ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ගිණුම් පවත්වා ගැනීමට හිමිකම තිබිය යුතු ය.

(2) සෘජු සහභාගිකරුවකු විසින්, මුදල් නීති පනතේ සඳහන් මධ්‍යම රක්ෂිතාගාරයේ, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සහ ඒ සෘජු සහභාගිකරුට හිමිකම තිබෙන වෙනත් සහතික රහිත සුරැකුම්පත් දැරීම සඳහා සහ ඒ සෘජු සහභාගිකරුට සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්වල සහ සහතික රහිත වෙනත් සුරැකුම්පත්වල පවත්නා අයිතිය, මුදල් නීති පනත යටතේ සාදනු ලබන රීති හා නියෝගවලට අනුකූලව වාර්තාගත කර තැබීම සඳහා සුරැකුම්පත් ගිණුම් පවත්වාගෙන යා හැකි ය.

(3) සෘජු සහභාගිකරුවකු විසින් (2) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යන ගිණුම්වල, කල්පිරීමේ මුදල් ගෙවිය යුතු වන දිනයේ දී සෘජු සහභාගිකරු අයිතිකරු ලෙස වාර්තාගතව තිබෙන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරීමේ මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෘජු සහභාගිකරුට ගෙවනු ලැබිය යුතු ය.

(4) සෘජු සහභාගිකරුවකු විසින් ඊටම අයත් ගිණුමේ දරනු ලබන හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් වන විට ඊටම අයත් ගිණුමේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වල දරනු ලබන යම් සහතික

රහිත භාණ්ඩාගාර බිල්පත් පිළිබඳව හෝ ඒ බිල්පත් කෙරෙහි බලපෑමක් සහිත යම් පොත්පත්, වාර්තා හෝ ගිණුම් පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ලබා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය විය හැකි හා ඉල්ලා සිටිනු ලැබිය හැකි සියලු පොත්පත්, වාර්තා, හුවමාරු වූ ලිපි හෝ වෙනත් යම් ලේඛන, සෘජු සහභාගිකරු හෝ එහි නිලධරයන්, අධ්‍යක්ෂවරයන්, සේවා නියුක්තයන් හෝ සේවකයන් විසින් සැපයිය යුතු අතර, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම හා සම්බන්ධව මේ ආඥාපනතින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැනවී තිබෙන කාර්ය ඉටු කිරීම සඳහා ඊට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතු ය.

මේ වගන්තියේ විධිවිධාන, විද්‍යුත් ස්වරූපයකින් පවත්වාගෙන යනු ලබන යම් පොත්පත්, වාර්තා, ගිණුම් හා ලිපි හුවමාරු කෙරෙහි අදාළ වන්නේ ය.

(5) සහතික රහිත භාණ්ඩාගාර බිල් පත්‍රයක් වෙනුවෙන් ආණ්ඩුවට යම් වගකීමකට යටත්වීමට සිදුවන හෝ යම් කල්පිරීමේ ගෙවීමක් කිරීමට සිදු වන්නා වූ ද සෘජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවකුගේ පැහැර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් හෝ පැහැර හැරීමක් හේතුකොටගෙන එම වගකීම උද්ගත වන්නා වූ හෝ ගෙවීම කරනු ලබන්නා වූ අවස්ථාවක, ආණ්ඩුව විසින් ඉල්ලා සිටි විට ඒ වගකීම හෝ ගෙවීම සම්බන්ධයෙන් ආණ්ඩුවට හානි පූරණය කිරීමට ඒ සහභාගිකරු බැඳී සිටින්නේ ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හැරීම" යන්නට :—

(අ) යම් සෘජු සහභාගිකරුවකු වෙත හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවකු වෙත මේ අඥාපනතින් හෝ මේ ආඥාපනත මගින් කටයුතු කෙරෙන යම් කාරණයකට අදාළ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ පැවරී ඇති හෝ නියම වී ඇති යම් කර්තව්‍යයක් කිරීමෙහි හෝ කාර්යයක් ඉටුකිරීමෙහි ලා ඔහුගේ පාර්ශ්වයෙන් සිදුවන යම් නොසැලකිල්ලක් හෝ පැහැර හැරීමක් ; සහ

(ආ) මේ ආඥාපනත යටතේ වරදක් සංයුක්ත වන හෝ මේ ආඥාපනත අදාළවන යම් කාරණයක් සම්බන්ධ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වරදක් සංයුක්ත වන, සෘජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවකුගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්–

(i) ඒ වරද සම්බන්ධ යම් නඩු පැවරීමක් සිදු වී තිබුණ ද නොතිබුණ ද ;

(ii) ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සෘජු සහභාගිකරු විසින් හෝ අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් හෝ ඒ සෘජු සහභාගිකරුගේ හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුගේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තියකු හෝ නියෝජිතයකු විසින් හෝ කරන ලද්දක් වුවද,

ඒ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ඇතුළත් වේ.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි (2), (3), (4), (5), (6), (7), (8) සහ (9) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පවත්වාගත යුතු යයි නියමිත ගිණුම් පවත්වාගෙන යාමට අමතරව, සෘජු අලෙවිකාර සහභාගිකරුවකු විසින් එහි එක් එක් ගනුදෙනුකරු සඳහා, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් හා එක් එක් ගනුදෙනුකරුට හිමිකම තිබෙන වෙනත් සහතික රහිත සුරැකුම්පත් දැරීම පිණිස සහ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් හා සහිත රහිත වෙනත් සුරැකුම්පත්වලට ඒ එක් එක් ගනුදෙනුකරුගේ බැඳියාවත් වාර්තාගත කිරීම පිණිස, මුදල් නීති පනත යටතේ සාදන ලද නියෝගවලට හා රීතිවලට අනුකූලව, මුදල් නීති පනතේ සඳහන් රක්ෂිතාගාරයක ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

(3) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් ගෙවීම්වලට අමතරව, එම අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් (2) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යන ගිණුම්වල, එම කල්පිරීමේ මුදල් ගෙවිය යුතු දිනයේ දී යම් සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් අයිතිකරු ලෙස ඒ අලෙවිකාර සෘජු සහභාගිකරුගේ යම් ගනුදෙනුකරුවකු වාර්තාගතව සිටී ද එම ගනුදෙනුකරුට හිමි සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරීමේ මුදල සෘජු අලෙවිකාර සහභාගිකරුට ගෙවිය යුතු ය.

(4) අලෙවිකාර සෘජු සහභාගිකරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු කටයුතු නොකළ යුතු ය. සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්‍ර පැවරීමට හෝ තමන් වෙත පැවරීමක් ලබාගැනීමට අපේක්ෂා කරන, සෘජු සහභාගිකරුවකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව නොවන යම් තැනැත්තකු විසින් එය අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් පමණක් සිදු කළ යුතු ය.

(5) අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් මේ ආඥාපනත යටතේ තම කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට හැකිවනු පිණිස සහ එහි ගනුදෙනුකරුවන් වෙතට ඇති බැඳීම් ඉටුකළ හැකි වනු පිණිස පොත්පත් හා වාර්තා පවත්වාගත යුතු අතර, ඒ කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ යම් විධාන ඇත්නම්, ඒ විධානවලට අනුව කටයුතු කළ යුතු ය.

(6) ගනුදෙනුකරුවකුගේ ගිණුමක දරනු ලබන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් (3) වන උපවගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ගෙවීමක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් අලෙවිකාර සෘජු සහභාගිකරුවකුට ලැබුණු විටක, අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් එම මුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කර තිබෙන යම් විධානයක නිශ්චිතව දැක්වෙන කාලය ඇතුළත අදාළ ගනුදෙනුකරුට හෝ එම ගෙවීම ලැබීමට නීතිය අනුව හිමිකම තිබෙන වෙනත් යම් පාර්ශ්වයකට හෝ සෘජු අලෙවිකාර සහභාගිකරු සහ ගනුදෙනුකරු පාර්ශ්වකරුවන් වන යම් ලිඛිත ගිවිසුමකට අනුකූලව හෝ ගෙවිය යුතු ය.

(7) ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ විධානවල නිශ්චිතව දැක්වෙන කාලය ඇතුළත ගනුදෙනුකරුට හෝ (6) වන උපවගන්තියට අනුකූලව හිමිකම තිබෙන පාර්ශ්වයකට ගෙවීම්

කිරීමට යම් හේතුවක් මත අලෙවිකාර සෘජු සහභාගිකරුවකුට නොහැකි වන්නේ නම්, අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් එම නොගෙවා ඉතිරිව තිබෙන මුදල, එකී විධානවල නිශ්චිතව දැක්වෙන යම් කාලසීමාවක් ඇතුළත, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමිත ගිණුමකට මාරු කළයුතු අතර, එම ගෙවීම් පිළිබඳව සහ අවස්ථාවෝචිත පරිදි ගනුදෙනුකරු හෝ වෙනත් පාර්ශ්වකරු පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව නියම කරන තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

(8) (7) වන උපවගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමිත ගිණුමකට මාරු කරනු ලබන මුදල් ප්‍රමාණයන්, ඒ සඳහා හිමිකම ඇති තැනැත්තන්ට ගෙවනු ලැබිය යුතු අතර, හිමිකම් ඉදිරිපත් නොකර ඉතිරිව තිබෙන යම් මුදල් ප්‍රමාණයක් පිළිබඳව තත් කාර්යය සඳහා සාදා තිබෙන නියෝගවලින් නියමිත පරිදි කටයුතු කිරීම හෝ සුදුස්සක් කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය යුතු ය.

(9) ගනුදෙනුකරුවකු සඳහා පවත්වාගෙන යන ගිණුම් පිළිබඳව හා, ඒ හා සම්බන්ධ යම් කාරණයක් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු එහි ව්‍යාපාර කටයුතු හා පරිපාලනය නිසි පරිදි කරගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රමාණයට හැර, රහස්‍යභාවය පවත්වා ගත යුතු අතර, ගනුදෙනුකරු විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබුවහොත් හෝ කිසියම් නීතියක් යටතේ නැතහොත් අධිකරණ නියෝගයක් මගින් නියමිතව ඇති අවස්ථාවක මිස, ශ්‍රී ලංකා මහ බැංකුවට හැර වෙනත් කිසිම තැනැත්තකුට, ගනුදෙනුකරුවකුගේ ගිණුමක් පිළිබඳව නිසි තොරතුරක් හෙළිදරව් නොකළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, මෙහි පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:–

"සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පැවරීම.

11. (1) 10 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ගනුදෙනුකරුවකු සඳහා පවත්වාගෙන යන ගිණුමකින් හෝ ගිණුමකට අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් යම් සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්‍රයක හිමිකම පැවරීමක් කරනු ලැබූ අවස්ථාවක හෝ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්‍රයක යම් ගනුදෙනුකරුවකුගේ යම් බැඳියාවක් වාර්තාගත කරනු ලැබූ හෝ එවැනි යම් ගිණුමක සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්‍රයක් පිළිබඳ යම් සංශෝධනයක් හෝ විචලනයක් කරනු ලැබූ අවස්ථාවක, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට

අනුකූලව, එම අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් අදාළ ගනුදෙනුකරුට ඒ පිළිබඳ තහවුරු කිරීමක් නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලින්, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා රක්ෂිතාගාර පහසුකම් සපයන්නකුට ඒ රක්ෂිතාගාරයේ පවත්වාගෙන යන ගිණුම් පිළිබඳව ප්‍රකාශ හෝ තහවුරු කිරීම් නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල් නීති පනත යටතේ පනවා ඇති යම් බැඳීම්වල බලහීන කරනු ලබන්නේ යයි අර්ථ කථනය නොකළ යුතු අතර, රක්ෂිතාගාරයක් විසින් එසේ නිකුත් කරනු ලැබූ ප්‍රකාශයක් හෝ තහවුරු කිරීමක් සහ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් ප්‍රකාශයක් හෝ තහවුරු කිරීමක් අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් පවත්නා විටක, රක්ෂිතාගාරය විසින් නිකුත් කළ ප්‍රකාශය හෝ තහවුරු කිරීම බලපැවැත්විය යුතු ය.

(3) යම් ගනුදෙනුකරුවකු විසින් යම් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් ලබාගන්නා ලද හෝ කරන ලද සියලු පැවරීම් සම්බන්ධයෙන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු, අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, ගනුදෙනුකරුවන්ට සම්පූර්ණයෙන් වගකිව යුතු හා බැඳී සිටිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් තහවුරු කිරීම ප්‍රමන්ත්‍රණයකට විෂය කරගනු ලැබිය නොහැකි අතර, එය අදාළ වන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධව එම අලෙවිකාර සෘජු සහභාගිකරු සහ ගනුදෙනුකරුවකු අතර ගනුදෙනු පිළිබඳ සාක්ෂි වශයෙන් පමණක්ම ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ නියමිත යම් නිවේදනයක් හෝ තහවුරු කිරීමක් හෝ පිළිගැනීමක් හෝ ලදුපතක් ලිඛිතව නොවන ආකාරයකින් නිකුත් කළහැකි බවට සහ එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තත් කාර්යය සඳහා කලින් කල නිශ්චිතව සඳහන් කරන විදුලි පණිවුඩ, දුරකථන, චන්ද්‍රිකා, කේබල් හෝ වෙනත් යම් විද්‍යුත් චුම්බක හෝ දෘශ්‍ය මාධ්‍යයක් මගින් සම්ප්‍රේෂණය කිරීම

හෝ භාරදීම කළ හැකි බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(6) සහතික රහිත භාණ්ඩාගර බිල්පතක් විද්‍යුත් මාර්ගයෙන් වාර්තා ගත කිරීමක හෝ මේ ආඥාපනතේ කාර්ය සඳහා විද්‍යුත් ස්වරූපයකින් නිකුත් කරන හෝ පවත්වාගෙන යන යම් නිවේදනයක, තහවුරු කිරීමක, පිළිගැනීමක, ලදුපතක හෝ වෙනත් ලේඛනයක හෝ වාර්තාවක, නෛතික බලපෑම, වලංගු භාවය හෝ බලාත්මක කිරීමේ හැකියාව, හුදෙක් එම සහතික රහිත භාණ්ඩාගාර බිල්පත විද්‍යුත් ස්වරූපයකින් පවත්වාගෙන යාමේ හෝ එම නිවේදනය, තහවුරු කිරීම, පිළිගැනීම, ලදුපත හෝ වෙනත් ලේඛනය හෝ වාර්තාව විද්‍යුත් ස්වරූපයකින් නිකුත් කිරීමේ හා පවත්වාගනෙ යාමේ හේතුව මත නොපිළිගෙන ප්‍රතික්ෂේප නොකළ යුතු අතර, 1995 අංක 14 දරන, සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ II වන සහ III වන කොටස්වලට හෝ යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ පරිගණක සාක්ෂි ඉදිරිපත් කිරීම හා සම්බන්ධව, තත්කාලීනව බලපවත්නා වෙනත් යම් නීතියකට හෝ අනුකූලව යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක පැවැත්වෙන නඩු කටයුත්තක දී ඒ නිවේදනය, තහවුරු කිරීම, පිළිගැනීම, ලදුපත හෝ වෙනත් ලේඛනය සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.”.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(2) මේ ආඥාපනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට හෝ ඒ වරද කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකුට මූල්‍යමය අලාභයක් හෝ මූල්‍යමය ලාභයක් හෝ මුදලින් ප්‍රමාණ කළහැකි අලාභයක් නැතහොත් ලාභයක් විඳින්නට සිදු වී ඇති අවස්ථාවක, එම අලාභයේ හෝ ලාභයේ ප්‍රමාණය මෙන් දෙගුණයක් හා සමාන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ සහ 15ආ යන වගන්ති ඇතුළත් කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 15අ සහ 15 ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු කිරීම.

15අ. මේ ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පැවරීම, ඔඩපනය කිරීම, බැඳීමකට යටත් කිරීම, ණයට දීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරව ඒ පිළිබඳ ගනුදෙනු කිරීම නියෝග මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි කරනු ලැබිය හැකි අතර, ඒ අනුව කරන ලද යම් පැවරීමක්, ඔඩපනය කිරීමක්, බැඳීමකට යටත් කිරීමක්, ණයට දීමක්, ණයට ගැනීමක් හෝ වෙනත් යම් ගනුදෙනු කිරීමක්, ලිඛිත සහතික ස්වරූපයෙන් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු කිරීමට අදාළව වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, වලංගු හා බලසහිත වන්නේ ය.

වැරදි සමථයට පත් කිරීම.

15ආ. (1) මේ ආඥාපනත යටතේ යම් වරදක් සිදු කරන ලද්දේ කවර අවස්ථාගත තත්ත්වයක් යටතේ ද යන කාරණය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, අධිකරණයේ එකඟත්වය ඇතිව, එම වැරදි රුපියල් මිලියන පහක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට හෝ එම වරද යම් තැනැත්තකුට මූල්‍යමය අලාභයක් හෝ මූල්‍යමය ලාභයක් හෝ මුදලින් ප්‍රමාණ කළහැකි අලාභයක් නැතහොත් ලාභයක් විඳින්නට සිදු වී ඇති අවස්ථාවක, එම අලාභයේ හෝ ලාභයේ අගය මෙන් එකහමාරක මුදල් ප්‍රමාණයකට සමථයට පත් කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වරදක් සමථයකට පත් කිරීම නිදොස් කිරීමක් ලෙස බලපැවැත්විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "ගනුදෙනුකරු" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"ගනුදෙනුකරු" යන්නට, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු

මගින් සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් හෝ ඒවායේ යම් සම්බන්ධතාවක් මිල දී ගන්නා හෝ විකුණන හෝ අන්‍යාකාරයකින් අත්කර ගන්නා හෝ බැහැර කරන යම් තැනැත්තෙක් හෝ ඒ බිල්පත් නැතහොත් ඒවායේ යම් සම්බන්ධතාවක් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ ඉඩකඩ ගැන ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු සමඟ ගනුදෙනු සාකච්ඡා පවත්වන යම් තැනැත්තෙක් ඉන් අදහස් වන අතර, එයට පද සම්බන්ධය අනුව අවශ්‍ය අවස්ථාවල දී ඒ ගනුදෙනුකරුගේ හෝ ඒ ගනුදෙනුකරුගේ බූදලයේ හෝ නීත්‍යනුකූල නියෝජිතයා ඇතුළත් වේ.

(2) "අන්තර් අලෙවිකාර තැරැව්කරු" යන යෙදුමෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ කථනය එකතු කිරීමෙන් :–

"මුදල් නීති පනත" යන්නෙන්, වරින් වර සංශෝධිත පරිදි වූ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත අදහස් වන අතර, එයට ඒ පනතේ අන්තර්ගත කාරණාවලට අදාළව ඒ පනත ප්‍රතියෝජනය කරන යම් නීති ප්‍රඥප්තියක් අදහස් වන අතර මේ ආඥාපනතේ එහි යම් වගන්තියක් පිළිබඳව නිශ්චිතව සඳහන් වන අවස්ථාවක දී ඒ සඳහනට, තදනන්තර නීති ප්‍රඥප්තියේ අනුරූප වගන්තිය පිළිබඳ සඳහනක් ඇතුළත් වන සේ සැලකිය යුතු ය.

"සුරැකුම්පත් ගිණුම" යන්නෙහි (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.